# පාවහන් සහ සම්භාණ්ඩ මෝස්තර නිර්මාණ තරගය 2016

**1. තරග නීති හා කොන්දේසි :**

1.1 රැකියාවක් ලෙස හෝ ස්වයං රැකියාවක් ලෙස හෝ ශිෂ්‍යයකු ලෙස හෝ පාවහන් නිෂ්පාදන කර්මාන්තයක හෝ ස්වයං රැකියා මට්ටමේ කර්මාන්තයක මෝස්තර නිර්මාණයේ නිරත වන අවු. 18ට වැඩි ශ්‍රී ලාංකිකයනට පමණක් මෙම තරගය සඳහා ඉල්ලුම් කළ හැක. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ට මෙම තරගය සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.2 තරගය වට දෙකකින් සමන්විත වේ.
පළමු වටය : කඩදාසි මත අඳින ලද මෝස්තර
දෙවන වටය : මෝස්තරයට අදාලව කරන ලද භාණ්ඩ නිෂ්පාදනය

1.3 පහත සඳහන් අංග එකක් හෝ කිහිපයක් යටතේ උපරිම නිර්මාණ දෙක බැගින් ඉදිරිපත් කල හැකිය.

**පාවහන්** : ■ කාන්තා පාවහන් (High heel & Boot)
■පිරිමි පාවහන් (shoe & boots)

**සම් භාණ්ඩ** : ■ කාන්තා අත් බෑග් / ට්‍රැවල් බෑග් / බැක් පැක්ස්

**විශේෂ කාණ්ඩය** ( ■ කාන්තා හා පිරිමි සැන්ඩ්ල්ස් හෝ ස්ලිපර්ස් (ශ්‍රී ලාංකිය අනන්‍යතාවය තහවුරු වන පරිදි දේශිය ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කල සංචාරක වෙළඳපළ අරමුණු කරගත් නිර්මාණයක් විය යුතුය)

අ) සුදුසුකම් - ඉදිරිපත් කරනු ලබන මෝස්තර ජාත්‍යන්තර වෙළඳපොලට ගැලපෙන ඒවා විය යුතුය.
ආ) අමුද්‍රව්‍ය - සම් - රබර් - පීවීසී - රෙදි හෝ වෙනත් සුදුසු අමුද්‍රව්‍ය.

1.4 **තෝරාගැනීමේ පිළිවෙළ:**

තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන මෝස්තර විනිශ්චයේදී තරග විනිශ්චයකරුවන් පහත සඳහන් කරුණු කෙරෙහි වැඩි අවධානයක් දක්වනු ඇත.

- සංකල්පමය අදහසක් වීම
- තාක්ෂණික නිවැරදිතාවය.
- අලෙවි කිරීමේ හැකියාව.
- සුව පහසුව.
- අමුද්‍රව්‍ය නාස්තිය අවම වීම
- මෝස්තරකරණයේ සම්මතයන් හා නිෂ්පාදන ක්‍රියාවලිය
- විදේශ වෙළඳපොල අලෙවිය සඳහා නිෂ්පාදනය කිරීමේ හැකියාව.
- නිවැරදි අමුද්‍රව්‍ය සහ වර්ණ සංයෝජනය.

1.5 තරගයේ පළමු වටය සඳහා ඉදිරිපත් කරන මෝස්තර නිර්මාණය කළ යුතු වන්නේ කඩදාසි මත පමණි. අවසාන වටය සඳහා සුදුසුකම් ලදහොත් එම මෝස්තරය නිෂ්පාදනය කිරීමේ වගකීම අයදුම්කරු සතු වන අතර, ඒ බවට ලිඛිතව සහතිකයක් ඉදිරිපත් කළ යුතුවේ. (අයදුම් පත්‍රය සමග)

1.6 කඩදාසි මත අඳින ලද මෝස්තර: (පළමු වටය සඳහා)
(අ) සම්ප්‍රදායික චිත්‍ර මාධ්‍ය හෝ පරිගනක මාධ්‍ය (Raster, vector or cad Application) යොදා ගත හැක.
(ආ) සෑම මෝස්තරයක්ම අදාල ප්‍රමාණයට සකස් කරන ලද කඩදාසි මත ඇඳ හෝ පරිගණක මාධ්‍ය භාවිතා කරන්නේ නම් මුද්‍රණය කර භාර දිය යුතුය. (කඩදාසි ප්‍රමාණය A4)
(ඇ) මෝස්තරය සඳහා යොදා ගන්නා වර්ණ අවසාන වටයේදී නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩයේ වර්ණයන්ට සමාන විය යුතුය.
(ඈ) අදාල මෝස්තර නියමිත ප්‍රමාණයකට හෝ පරිමාණයකට ඇඳිය යුතු අතර එම ප්‍රමාණය සඳහන් කල යුතුය. එමෙන්ම. ඉදිරිපත් කරන මෝස්තර ඉදිරිපසින් හා පැත්තෙන් දිස්වන ආකාරය පිළිඹිබු කරන චිත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතුය.

1.7 සියලුම මෝස්තර තමන්ගේම මුල් නිර්මාණ විය යුතුය. තරගයට ඉදිරිපත් කරන මෝස්තර, පොත්පත් වලින් ලබා ගන්නා ලද මෝස්තර අන්තර්ජාලය හෝ පරිගණක මාධ්‍යයෙන් නැවත නිර්මාණය කල ඒවා නොවිය යුතුය.

ඔබ විසින් තරගය සඳහා ඉදිරිපත් කරන මෝස්තරය / මෝස්තර නිර්මාණය කිරීම සඳහා ඔබ විසින් කරන ලද මූලික කටයුතු / පියවර දැනගැනීම සඳහා අංගල දළ සටහන් / රූප ආදිය ද මෝස්තර සමග භාර දිය යුතුය. (ආදර්ශ මෝස්තරයක් මේ සමග අමුණා ඇත.)

(ඉදිරිපත් කරන ලද මෝස්තරය තමන්ගේම නිර්මාණයක් / මුල් නිර්මාණයක් නොවන බව දැනගැනීමට ලැබුනහොත් විනිශ්චය මණ්ඩලයේ අදහස් විමසීමෙන් පසුව, අදාල ත්‍යාග / සහතික පත් ආපසු ලබා ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සතුවේ.)

1.8 තරගයට ඉදිරිපත් කරනු ලබන සෑම මොස්තරයක් සමගම, නිසි ලෙස සම්පූර්ණ කරන ලද නියමිත අයදුම් පත්‍රයත්, මොස්තරයේ ඡායා පිටපත් සහ පිරිවිතර පත්‍රිකාව. 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා භාර දිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**පාවහන් සහ සම්භාණ්ඩ මෝස්තර නිර්මාණ තරගය - 2016**" යනුවෙන් සඳහන් කළ යුතුයි. (එක් මෝස්තරයකට වඩා ඉදිරිපත් කරන විට වුවද එක් අයදුම් පත්‍රයක් පමණක් ප්‍රමාණවත් වේ )

1.9 සෑම මෝස්තරයක් පිටුපසම අදාල මෝස්තරය ඉදිරිපත් කරන නිෂ්පාදන අංශය (1.3 බලන්න) සඳහන් කළ යුතු අතර ජාතික හැදුනුම්පත් අංකය සහ අත්සන සෑම මෝස්තරයක් පිටුපසම සඳහන් කළ යුතු වේ. මීට අමතරව නම් හෝ ලකුණු ආදි හදුනාගැනීමේ කිසිදු සලකුණක් මෝස්තරය මත හෝ පිටුපස සඳහන් නොකළ යුතුයි.

1.10 සෑම මෝස්තරයක් සමගම, එම මෝස්තරයේ ජායා පිටපත් ද භාර දිය යුතුයි. මෙම ජායා පිටපත පිටුපස මෝස්තර නිර්මාණය කළ තරගකරුගේ **අත්සන, නම, ලිපිනය. ජාතික හැදුනුම්පත් අංකය සහ නිෂ්පාදන අංශය යතුරුලියනය කර හෝ පැහැදිලි අකුරින්** සඳහන් කරන්න.

1.11 ඔබට ලබා දී ඇති පිරිවිතර පත්‍රිකාව specification sheet සම්පූර්ණ කර භාර දිය යුතුය. මෙම පිරිවිතර පත්‍රිකා එක් නිර්මාණයකට එක බැගින් තිබිය යුතුය. නිර්මාණය කළ තරගකරුගේ **ජාතික හැදුනුම්පත් අංකය සහ අත්සන** පිරිවිතර පත්‍රිකාවේ පිටුපස සඳහන් කළ යුතුයි. මෝස්තරයේ මුල් පිටපතට අදාල පිරිවිතර පත්‍රිකාව එයට අමුණන්න. (අතිරේක තොරතුරු ඇත්නම් වෙනම පත්‍රිකාවක් අමුණන්න)

1.12 අවසාන වටයට තෝරාගත් අයට, භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණය සහිත මුල් පිටපත් නැවත ඔවුන් හට භාර දෙනු ලැබේ.

1.13 නිෂ්පාදනය කර ඉදිරිපත් කරන භාණ්ඩ භාර දෙන දිනයේදී එම භාණ්ඩ සමග ඔබට ලබා දුන් මෝස්තරවල මුල් පිටපත්, පිරිවිතර පත්‍රිකා, මෝස්තරයේ පතරොම්(Pattern components) පිරිවැය පත්‍රිකාව(costing Sheet), නිෂ්පාදන ක්‍රියාවලිය:(Production Sheet) භාරදිය යුතුය.

1'14 මෝස්තර තරගයට ඉදිරිපත් කරනු ලැබූ මෝස්තර නිර්මාණයන් ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමේ අදහසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හෝ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත රදවා තබා ගැනීමේ බලය එම මණ්ඩලයන් සතුවේ.

1'15 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයකින් මෙම තරගය විනිශ්චය කරනු ලැබේ.

1.16 තරග විනිශ්චයකරුවන්ගේ තිරණය අවසාන තිරණය වේ.

2.0 **<u>මෝස්තර තරගය සඳහා ප්‍රදානය කරනු ලබන සම්මාන සහ ත්‍යාග:</u>**

තරගය සඳහා ඉදිරිපත් කර ඇති පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශ සඳහා (ඉහත 1.3 හි සඳහන් වන) වෙන වෙනම (1) වන (2) වන සහ (3) වන ස්ථාන වෙනුවෙන් මුදල් සහ සම්මාන ත්‍යාග පහත දැක්වෙන අයුරින් පිරිනැමේ.

පළමු ත්‍යාගය කුසලානයක් සහ රු. 25,000/- ක මුදල් ත්‍යාගයක්
දෙවන ත්‍යාගය කුසලානයක් සහ රු. 15,000/- ක මුදල් ත්‍යාගයක්
තෙවන ත්‍යාගය කුසලානයක් සහ රු. 10,000/- ක මුදල් ත්‍යාගයක්

3.0 **<u>තරග කාල සටහන</u>**

3.1 ඇතුලත් වීමේ පත්‍රිකා නිකුත් කිරීම **2015** ඔක්තෝම්බර් **මස 12 වැනි දින සිට** නොවැම්බර් 12 **වැනි දින** දක්වා වේ.

3.2 කඩදාසි මත අදින ලද සියලුම මෝස්තර නිර්මාණයන් අධ්‍යක්ෂ. සම්භාණ්ඩ සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය, අංක 280/1, දි මෙල් පාර, කටුබැද්ද, මොරටුව වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් **2015 දෙසැම්බර්** 04 වන දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3.3 අවසාන වටයට තේරෙන තරගකරුවන් / තරගකාරියන් හට ලිපියකින් ඒ බව දැනුම් දෙනු ලැබේ.

3.4 තෝරාගනු ලැබූ මෝස්තර නිර්මාණවලට අනුකූලව නිෂ්පාදනය කල භාණ්ඩ අධ්‍යක්ෂ. සම්භාණ්ඩ සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය, අංක 280/1, දි මෙල් පාර, කටුබැද්ද, මොරටුව වෙත **2016 ජනවාරි 15** වන දිනට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3.5 **අවසාන විනිශ්චය 2016 ජනවාරි මස 21** වන දින සිදු කරන අතර තරග **ප්‍රතිඵල ප්‍රකාශ කිරීම 2016 පෙබරවාරි මස 7 වන දින** සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන ශාලාවේදී සිදු කෙරේ.